# ප්‍රවාද නොන්ඩිය

මෙරට පමණක් නොව බටහිර සමාජයීය විද්‍යාඥයන්ට ද ප්‍රවාදයක් යනු කුමක්දැයි පැහැදිලිව තේරුම් ගැනීමට නොහැකි වී ඇත. අද බටහිර ප්‍රවාද හෙවත් තියරි යන්න සමාජයීය දැනුම් පද්ධතිය තුළ කියැවෙන වචනයක් බවට පත් වී තිබේ. ප්‍රවාද යනු මොනවා ද? මේ ප්‍රශ්නයට ද පිළිතුරක් දිය යුතුව ඇත. මේ ලිපි පෙළේ තේමාව වනුයේ ද අපේ ප්‍රවාද යන්න ය. එහෙත් අපි මේ වන තුරු ප්‍රවාද ගැන තරමක් හෝ ගැඹුරින් සාකච්ඡා නොකෙළමු. එසේ ම අප ගොඩ නගන්නේ, එනම් නිර්මාණය කරන්නේ කිනම් ප්‍රවාද යන්න ද සඳහන් වී නැත.

මේ පිළිබඳ සාකච්ඡාවක් කිරීමට පෙර කිවයුතු වෙනත් කරුණු කිහිපයක් වෙයි. ප්‍රවාද යනු කතන්දර ය. ඒ කතන්දර නිර්මාණය කෙරෙන්නේ ද මිනිසුන් අතිනි. මේ දේව භාෂිත නොවේ. එහෙත් අප ප්‍රවාද හෙවත් තියරි ගැන කල්පනා කිරීමට පෙළඹී සිටින්නේ එසේ නොවේ. විශේෂයෙන් ම සමාජයීය විද්‍යා හදාරන්නන්ට ඒ පිළිබඳ දැනුමක් නැත.ඔවුන් ප්‍රවාද ගැන දන්නේ දේව භාෂිත ලෙස ය. එයට හේතුවක් වෙයි. ප්‍රවාද යන්න තියරි (theory) යන ඉංගිරිසි වචනය සඳහා සිංහලෙන් යොදා ගැනෙන වචනය වෙයි. තියරි යන ඉංගිරිසි වචනය දේව ධර්මය හඳුන්වන තියොලොජි (theology) යන වචනය සමග බැඳී ඇත. තියෝ (theo) යන යෙදුම දෙවියන් වහන්සේ හා සමග සම්බන්ධ ය. ඉංගිරිසි සංස්කෘතියෙහි තියරි කී විට දේව ධර්මයක් යන අදහස ගෙන දීම වැළැක්විය නොහැකි ය. බටහිර භෞතික විද්‍යාව ඇතුළු සියළු බටහිර විද්‍යා ගොඩ නැගී ඇත්තේ බටහිර යුදෙව් ග්‍රීක ක්‍රිස්තියානි සංස්කෘතියෙහි ය යන්න මේ වන විට බොහෝ දෙනාට පැහැදිලි වී ඇතැයි සිතමි. තියරි යන වචනය ද ව්‍යවහාරයට පැමිණියේ ඒ සංස්කෘතිය තුළම ය.

බටහිරයන් ඉතා වැඩි ප්‍රමාණයක් අදත් කල්පනා කරන්නේ විද්‍යාවේ, එනම් බටහිර විද්‍යාවේ අරමුණ දෙවියන් වහන්සේ මවා ඇති ලෝකයෙහි නියම කවරේදැයි දැන ගැනීම බව ය. නියම හෙවත් ලෝස් (laws) යන වචනය ද ලැබෙන්නේ දෙවියන් වහන්සේ ගේ නියම යන අරුතිනි. දෙවියන් වහන්සේ නියම, නීතිය ලෝකයෙහි ක්‍රියාත්මක වෙයි. ඒ නියම කවරේදැයි සොයා ගැනීම විද්‍යාඥයන් ගේ කාර්යභාරය යැයි අදත් ඇතැම් බටහිර විද්‍යාඥයෝ සිතති. නිව්ටන් පඬිවරයා ගේ නමින් ඇති චලිත නියම හා ගුරුත්වාකර්ෂණ ප්‍රවාදය මේ සම්බන්ධයෙන් දිය හැකි ප්‍රධාන ම උදාහරණ දෙක වෙයි. නිව්ටන් පඬිවරයා තම ක්‍රිස්තියානි බව කිසිවිටෙකත් අමතක කළ තැනැත්තෙක් නොවේ. අනෙක් බටහිර විද්‍යාඥයන්ට ද යුදෙව් ක්‍රිස්තියානි සංස්කෘතියෙන් ගැලවීමක් නැත. ප්‍රවාද හා නියම ගැන මුල් අදහස් එසේ වුව ද බටහිර විද්‍යාඥයෝ කල් ගත වන විට ඒ වචනවල තිබූ දරදඬු අදහස් යම් ප්‍රමාණයකට ලිහිල් කළහ. ඔවුන්ට එසේ ලිහිල් කිරීමට සිදුවිණි යැයි කීම වඩා නිවැරදි ය.

එයට හේතුව වූයේ නියම හා ප්‍රවාද සදාකාලික  නොවන බව ඔවුන්ට වැටහීම ය. ප්‍රවාද වෙනස් කිරීමට සිදු වීය. නිව්ටන් පඬිවරයා ම ආලෝකයේ ගමන ගැන මුලින් ම ඉදිරිපත් කර තිබුයේ ලවක (corpuscular) ප්‍රවාදය ය. ඒ ප්‍රවාදයෙන් කියැවුණේ ආලෝකය අංශු මගින් ප්‍රචාරණය වන බව ය. එහෙත් පසුව එය නිරීක්ෂණ සමග සංගත නොවන බව පෙනී ගියේ ය. ඒ අවස්ථාවේ දී හියුගන්ස් හා වෙනත් පඬිවරුන් හරහා තරංග ප්‍රවාදය (wave theory) නිර්මාණය විණි. ආලෝකයේ ප්‍රචාරණය අංශු මගින් නොව තරංග ඔස්සේ සිදුවන බව නව ප්‍රවාදයෙන් කියැවිණි. එවිට කලින් තිබූ ලවක ප්‍රවාදය ඉවත් කිරීමට බටහිර භෞතික විද්‍යාඥයන්ට සිදු විය. මෙලෙස ප්‍රවාද වෙනස් කිරීමට සිදුවීම හේතුකොටගෙන ප්‍රවාද යනු සත්‍යය යන හැඟීම ද ක්‍රමයෙන් වෙනස් විය. එහෙත් බටහිර භෞතික විද්‍යාඥයෝ ප්‍රවාද යනු සත්‍යය නොවේ යැයි නොකීහ. ඔවුන් අද පවා සිතන්නේ ප්‍රවාද මගින් ක්‍රමයෙන් ඊනියා වාස්තවික යථාර්ථයකට ළඟාවන බව ය. බටහිර භෞතික විද්‍යාඥයන්ට ප්‍රවාද හෙවත් තියරි හා පරම සත්‍යයක් අතර ඇතැයි කියන සම්බන්ධය මුළුමනින් ම සිතෙන් ඉවත් කරගත නොහැකි ය.

එසේ වුවත් බටහිර භෞතික විද්‍යාඥයෝ ප්‍රවාද හා නිරීක්ෂණ අතර යම් සම්බන්ධයක් තිබිය යුතු බව පිළිගනිති. මෙය පූර්ණ සම්බන්ධයක් නොවන බව ද මෙහි ලා අවධාරණය කළ යුතු ය. ඇතැම් ඊනියා විද්‍යාවේ දාර්ශනිකයන් කුමක් කීව ද, ප්‍රවාදයක් නිරීක්ෂණ සමග මුළුමනින් ම සංගත වීමක් බටහිර භෞතික විද්‍යාඥයන්ට අවශ්‍ය නොවේ. මෙහි දී ඉතා වැදගත් ම ප්‍රවාදය වනුයේ නිව්ටෝනීය ගුරුත්වාකර්ෂණ ප්‍රවාදය ය. කලින් ද සඳහන් කර ඇති ආකාරයට ග්‍රහ

© Prof. Nalin De Silva

වස්තු සූර්යයාට සාපේක්ෂව එය වටා අචල ඉලිප්සවල ගමන් නොකරයි. ගුරුත්වාකර්ෂණ ප්‍රවාදයෙන් ග්‍රහ වස්තු එසේ අචල ඉලිප්සවල ගමන් කළ යුතු යැයි පැවසුණ ද ග්‍රහ වස්තු එලෙස චලනය නොවීම නිසා බටහිර භෞතික විද්‍යාඥයෝ නිව්ටෝනීය ගුරුත්වාකර්ෂණ ප්‍රවාදය ප්‍රතික්ෂෙප නොකරති. ප්‍රවාදයෙන් ලබාගන්නා නිගමන හා නිරීක්ෂණ අතර සියයට සියයක් ම එකඟතාවයක් නැති වුව ද බටහිර භෞතික විද්‍යාඥයන්ට එය ප්‍රශ්නයක් නොවේ.

එහෙත් බටහිර භෞතික විද්‍යාඥයෝ ප්‍රවාදයේ තිබෙන්නේ මෙසේ යැයි කියා පැන නොදුවති. යම් ප්‍රමාණයකට හෝ ප්‍රවාද (ඉන් ලබා ගන්නා නිගමන ද ඇතුළුව) හා නිරීක්ෂණ අතර එකඟතාවයක් තිබිය යුතු බව ඔවුහු විශ්වාස කරති. යම් අයුරකින් නිව්ටෝනීය ගුරුත්වාකර්ෂණ ප්‍රවාදයෙන් ලබාගන්නා නිගමනවලට අනුව ග්‍රහ වස්තු පරාවලයන්හි (parabolae) ගමන් කළ යුතු බව කියැවෙන්නේ යැයි සිතමු. එවැනි අවස්ථාවක බටහිර භෞතික විද්‍යාඥයෝ ප්‍රවාදයේ තිබෙන්නේ එසේ යැයි කියා එය තහවුරු කිරීමට හෝ විවාදයකින් පැන යැමට හෝ කටයුතු නොකරති. ප්‍රවාදයක් කවදා හෝ වෙනත් ප්‍රවාදයකින් ප්‍රතිස්ථාපනය වීමට හැකි බව ඔවුහු දනිති.

එහෙත් අවාසනාවකට බටහිර සමාජයීය විද්‍යාඥයන් තවමත් මේ පාඩම ඉගෙන ගැනීමට උනන්දුවක් දක්වන බවක් නොපෙනෙයි. මෙහි සිටින බටහිර සමාජ විද්‍යාව හදාරණ අනුකාරක ඇංකරයන්ට ප්‍රවාද පිළිබඳ මෙලෝ වැටහීමක් නැත. බටහිර සමාජ විද්‍යාඥයන්ට නිරීක්ෂණ හා ප්‍රවාද අතර ඇති සම්බන්ධය නොවැටහෙයි. බටහිර සමාජයීය විද්‍යා බටහිර භෞතික විද්‍යාව පසුපස නොන්ඩි ගසමින් යයි. ප්‍රවාද පිළිබඳ සංකල්පය බටහිර සමාජ විද්‍යා ලබාගන්නේ බටහිර භෞතික විද්‍යාවෙන් ය. අද බටහිර සමාජයීය විද්‍යාවන්හි පමණක් නොව සාමාන්‍යයෙන් මානව ශාස්ත්‍ර යැයි හැඳින්වෙන විෂයවල ද මේ ඊනියා ප්‍රවාද ගැන සඳහන් වෙයි. ඔවුන්ට ප්‍රවාද හෙවත් තියරි යනු නිරීක්ෂණ සමග සම්බන්ධයක් නැති, දේව භාෂිත ලෙස සැලකෙන ප්‍රකාශ පමණක් වන අවස්ථා ද වෙයි. අද බටහිර සාහිත්‍ය විචාරයෙහි පවා විචාරාත්මක ප්‍රවාදයක් (critical theory) වෙයි.

මෙහි දී ඉංගිරිසි අධ්‍යයනාංශයක එක්තරා කතුවරියක පසුගිය දා ඇගේ පර්යේෂණ පත්‍රිකාවක් ඉදිරිපත් කරමින් කී කරුණු කිහිපයක් සඳහන් කිරීම උචිත යැයි සිතමි. ඇයට අවශ්‍ය වූයේ සාහිත්‍ය විචාරයෙහි ද දේශපාලනයක් තිබෙන බව කීමට ය. මෙය ඊනියා පශ්චාත්නූතනවාදී අදහසක් ලෙස ඇතැමුන් දැක්ක ද සාහිත්‍ය විචාරයෙහි ඇති දේශපාලනික ස්වරූපයක් පිළිබඳ ව මෙරට කාලයක් තිස්සේ ම කතාබහට ලක් වී ඇත. මේ සාහිත්‍ය විචාර දේශපාලනය ගැන කීම සඳහා ඇය පළමුවෙන් ම කියා සිටියේ බටහිර තවත් පශ්චාත්නූතනවාදී ප්‍රවාදයක සඳහන් වන්නකි. ඒ ප්‍රවාදය අනුව  ඕනෑම ප්‍රවාදයකට දේශපාලන අන්තර්ගතයක් වෙයි. එහෙත් දැන් ප්‍රශ්නයක් පැන නගියි. ඕනෑම ප්‍රවාදයකට දේශපාලන අන්තර්ගතයක් ඇතැයි යන්න ද ප්‍රවාදයකි. එවිට ඒ ප්‍රවාදයට ද දේශපාලන අන්තර්ගතයක් වෙයි. මේ ප්‍රශ්නය, එනම් ඇය අනුකාරක ව ඉදිරිපත් කළ ප්‍රවාදයට ද දේශපාලන අන්තර්ගතයක් ඇත් ද යන ප්‍රශ්නය ඇසූ විට ඇය නිරුත්තර වූවා ය. එහෙත් ඇය ඒ වෙනුවට වෙනත් විකාර කියවීමට පටන් ගත්තා ය.

ඇය ඊනියා භාෂා නිර්මිත මිනිසා ගැන සඳහන් කරමින් භාෂාවක් නැතිව මිනිසුන් නොසිතන බව කීවා ය. මෙය ද තවත් කසිකබල් පශ්චාත්නූතනවාදී මතයකි. භාෂාවක් නොදන්නා ළදරුවන් නොසිතන්නේ දැයි  ඇගෙන් විමසූ විට ඇය ඉතා විෂ්මිත පිළිතුරක් දුන්නා ය. ඇය කියා සිටියේ ප්‍රවාදය, එනම් තියරිය අනුව ළදරුවන් නොසිතන බව ය. ඇය මෙයින් කියා සිටියේ තියරිය දේව භාෂිතයක් බවත් තියරියෙන් යමක් කියැවෙන්නේ නම් එය පිළිගතයුතු බවත් ය. බොහෝ ඊනියා සමාජයීය විද්‍යාඥයන්ට තියරි හෙවත් ප්‍රවාද පිළිබඳ අබමල් රේණුවක හෝ තරම අවබෝධයක් නැති බව මෙයින් පැහැදිළි වෙයි.  ළදරුවන් සිතන්නේ ද නැද්ද යන වග දැනගැනීමට කිසියම් ආකාරයක අධ්‍යයනයක් (පරීක්ෂණයක් යැයි කියමු) කිරීමේ අවශ්‍යතාවයක් මෙහි නැත. තියරිය යමක් කියන්නේ නම් ඒ පිළිගත යුතු ය. මෙහි දී අදාළ තියරිය ඊනියා පශ්චාත්ව්‍යුහවාදී (පශ්චාත්නූතනවාදී) මනෝවිශ්ලේෂකයකු වූ ලකාන් නම් තැනැත්තාගේ කසිකබල් බංකොළොත් ප්‍රවාදයකි. මේ බංකොළොත් ප්‍රවාදයට අනුව හා බටහිර වෙනත් මතවාදයකට අනුව මිනිසුන් භාෂාවන් යොදාගැනීමට පෙර සිතා නැත. බටහිර ප්‍රවාදවලට අනුව මිනිසුන් සැමදාමත් භාෂා දැන සිටියා නොවේ. බටහිර පරිණාම ප්‍රවාදවලට අනුව මිනිසා තම පරිණාමයේ එක්තරා වකවානුවක දී භාෂා නිර්මාණය කර ගත්තේ ය. එසේ නම් ලකාන්ගේ කසිකබල් ප්‍රවාදයට අනුව එසේ භාෂා නිර්මාණය කරගැනීමට පෙර මිනිසා සිතා නැත! එමෙන් ම ඒ බංකොළොත් ප්‍රවාදයට අනුව ළදරුවෝ නොසිතති.

© Prof. Nalin De Silva

මෙරට ඇතැම් මාක්ස්වාදීන් මතුරන කිසිම දිනක වලංගුව නොපැවති මාක්ස්වාදයේ දක්නට ලැබෙන සුප්‍රසිද්ධ කියමනක් ද  මෙහි දී මතකයට එයි. මේ තුට්ටු දෙකේ මාක්ස්වාදී අනුකාරකයන් කියන්නේ භාවිතයෙන් තොර න්‍යාය වඳ බව ය. මෙහි දී න්‍යාය යනුවෙන් යොදා ගැනෙන්නේ ප්‍රවාද සඳහා ය. එය ම වැරදි පරිවර්තනයකි. ඒ කෙසේ වෙතත් භාවිතයෙන් තොර ප්‍රවාද වඳ යන්නෙන් කියැවෙන්නේ කුමක් ද? භාවිතයෙන් තොර ප්‍රවාද යනුවෙන් ප්‍රකාශ තිබිය හැකි ද? ප්‍රවාදයක් ඇතැම් විට යල්පැන ගොස් ඇතැයි කිව හැකි ය. එහෙත් භාවිතයෙන් තොර යනු කුමක් ද? භාවිතයට නොගන්නා ප්‍රවාද නිර්මාණය කෙරෙන්නේ ද?

සමජයීය විද්‍යාඥයන්ට ප්‍රවාද ගැන අවබෝධයක් නැත. ප්‍රවාදයක් යනු යම්කිසි ප්‍රශ්නයකට දෙන පිළිතුරකි. මේ පිළිතුර මෙන් ම ප්‍රශ්නය ද බටහිර විද්‍යාවන්හි වියුක්ත වෙයි. ප්‍රවාදය හෙවත් පිළිතුර හා ඉන් ලබාගන්නා නිගමන, ප්‍රශ්නයට හේතු වූ සංසිද්ධිය හෝ සංසිද්ධි පමණක් නොව අදාළ තවත් සංසිද්ධි ද සමග යම් ප්‍රමාණයකට හෝ සංගත විය යුතු ය. ප්‍රවාදයක් අනිවාර්යයෙන් ම භාවිතා කරන්නක් විය යුතු ය. භාවිතා නොකරන ප්‍රවාද යනු නිරීක්‍ෂණවලට අදාළ නොවන දෑ වෙයි. එනම් නිරීක්‍ෂණ සමග කිනම් ආකාරයක හෝ සංගත බවක් නැති හුදු ප්‍රකාශ හෙවත් හිතළු වෙයි. (නිරීක්‍ෂණ ද යම් ප්‍රමාණයකට ප්‍රවාදය සමග බැඳී ඇති බවත් ප්‍රවාදයෙන් ස්වායත්ත නොවන බවත් මෙහි දී අවධාරණය කළ යුතු ය.)

බටහිර සමාජයීය විද්‍යාවන්හි දක්නට ලැබෙන මෙවැනි තකතීරු විහිළු බටහිර භෞතික විද්‍යාවෙහි දක්නට නොලැබෙයි. කිසිම බටහිර භෞතික විද්‍යාඥයෙක් ප්‍රවාදය අනුව මෙය මෙසේ යැයි නොකියයි. ප්‍රවාදයකට යම් තහවුරු වීමක් ලැබෙන්නේ දේශපාලනික හා සංස්කෘතික පසුබිමක බව සැබෑ ය. එහෙත් ඒ පිළිගැනීම ලැබීමේ දී ප්‍රවාදය භාවිතාවන්නක්, එනම් යම් යම් සංසිද්ධි පැහැදිළි කරන්නක් විය යුතු ය. ඊනියා භාවිතයෙන් තොර ප්‍රවාද බටහිර භෞතික විද්‍යාවේ නැත. බටහිර භෞතික විද්‍යාව පසුපස නොන්ඩි ගසමින් යන බටහිර සමාජයීය විද්‍යාවන්ට ප්‍රවාද ගැනවත් වැටහීමක් නැත.

**මහාචාර්ය නලින් ද සිල්වා**

© Prof. Nalin De Silva